
## මුද්දර ලෝකය

# කොළඹ ක්‍රමය



කොළඹ ක්‍රමයට උරදුන් රටවල බලවතුන් එක් රැස් වූ මොහොතක්

### අනුර සමරවීර

"කොළඹ ක්‍රමය"50 වන සංවත්සරය මේ වසරේ ජූලි මස 01 දිනට යෙදී තිබේ. ආසියානු හා ශාන්තිකර කලාපයේ රටවල් අතර ආර්ථික හා සමාජ සංවර්ධනය පිළිබඳ සහයෝගීතාව ඇති කරලීමේ මූලික තේමාව යටතේ පිහිටුවන ලද මෙම සංවිධානය දැනටමත් මෙම කලාපය තුළ ඉතා විශාල වැඩ කොටසක් ඉටුකර තිබේ.

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව දකුණු ආසියානු කලාපීය රටවල ජනතාව ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා අවශ්‍යතාවන් ඉටුකරගැනීම පිළිබඳව එම රටවල හා ඔවුන් ගේ මිතුරු රටවල් කිපයක අවධානය යොමු විය. මේ පිළිබඳව බුරුමයේ පැවති "බැංඩුං" සමුළුවේ දී ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා ද අවධාරණය කරනු ලැබිණි. පසුව 1850 ජනවාරි මස කොළඹ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් හතක විදේශ ඇමතිවරුන් ගේ රැස්වීමක දී ඉදිරිපත් වූ යෝජනාවක ප්‍රතිඵලයක් ලෙස මෙම සංවිධානය බිහි වීමේ අඩිතාලම සැකසිනි. එම වැඩ මුළුවට සහභාගි වූ රටවල් නම් ඕස්ට්‍රේලියාව, කැනඩාව, ඉන්දියාව, නවසීලන්තය, පාකිස්ථානය, මහා බ්‍රිතාන්‍ය හා ශ්‍රී ලංකාව යි. මෙහි දී ලංකාව නියෝජනය කළේ නිදහස් ලංකාවේ ප්‍රථම අගමැති ඩී.ඇස්.සේනානායක සහ එවකට මුදල් ඇමති ධුරය දැරූ ජේ.ආර්.ජයවර්ධන යන මහත්වරුන් ය. එම වසරේ දී ම සිඩ්නි නුවර දී වැඩි දියුණු වූ එම යෝජනාව ලන්ඩන් නුවර දී සැලසුමක් ලෙසින් ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු 1951 ජූලි 01 ද "කොළඹ ක්‍රමය" සංවිධානය ආරම්භ කරන ලදී.

කොළඹ ක්‍රමය එහි ආරම්භයේ සිට ම ආසියා හා ශාන්තිකර කලාපයේ රටවල සංවර්ධන ව්‍යාපෘතින්ට ජාත්‍යන්තර සහයෝගීතාව ලබාදීමට කටයුතු කළේ ය. එම ක්‍රියාවලිය හුදෙක් සංවර්ධිත රටකින්, සංවර්ධනය වන රටකට ලැබෙන ආධාර සැපයීමට පමණක් සීමා නොවූ අතර ආධාර ලබන සංවර්ධනය වන රටවල අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කිරීමේ වැඩ පිළිවෙළක අඩිතාලම ද විය.

එහි ප්‍රතිඵලයක් ලෙස ආසියා හා ශාන්තිකර කලාපයේ රටවල් අතර අත්දැකීම් හා සම්පත් හුවමාරු කරගැනීමට ද මඟ පැදුනි. ඒ අනුව, සාමාජික රටවල් අතර ආර්ථික හා සමාජීය සංවර්ධනය වැඩි දියුණු කිරීමේ ඒකාග්‍රතා සංකල්පය කොළඹ ක්‍රමය සාර්ථක වීමට රුකුලක් වූ බව පැහැදිලි වෙයි.

කොළඹ ක්‍රමයේ අපේක්ෂා පිළිබිඹු කරන 'එකමුතු වී සෞභාග්‍යය සැලසුම් කිරීම' යන්න එම ව්‍යාපාරයේ ආදර්ශ පාඨය වන අතර දැනුම සංකේතවත් කරන සම්ප්‍රදායානුකූල තෙල් පහන හා කර්මාන්ත සංකේතවත් කරන දැති රෝදය කොළඹ ක්‍රමයේ ලාංඡනයට ඇතුළත්ව තිබේ. ආසියානු කෘෂි ආර්ථිකයේ සාරවත් බව සංකේතවත් වී කරල් දෙකකින් ලාංඡනය ඔපවත් වී ඇත.

එදා රටවල් 7 කින් ගොඩනැගුණු කොළඹ ක්‍රමය මේ වන විට ජාත්‍යන්තර අන්තර් කලාපීය සංවිධානයක් ලෙස ගොඩනැගී තිබේ. මේ වන විට එහි සාමාජික රටවල් ගණන 24 කි. ඒවා නම් ඇෆ්ගනිස්ථානය, ඕස්ට්‍රේලියාව, බංග්ලාදේශය, භූතානය, කාම්බෝජය, ෆීජි දූපත්, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, ජපානය, කොරියාව, ලාඕසය, මාල දිවයින, මලයාසියාව, මියන්මාර්, නේපාලය, තායිලන්තය, පාකිස්ථානය, පැපුවා නිව්ගිනියාව, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය, ඇමරිකා එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව යි. මොංගෝලියාවට ආශ්‍රිත සාමාජිකත්වයක් ලැබී ඇත.

කොළඹ ක්‍රමය වෙනුවෙන් දැනටමත් අප රටින් මුද්දර 4 ක් නිකුත් කර තිබේ. ප්‍රථම මුද්දර දෙක 1952 වසරේ කොළඹ පැවති 'කොළඹ ක්‍රම ප්‍රදර්ශනය' වෙනුවෙන් නිකුත් කෙරිණි.

1971 දී කොළඹ ක්‍රම 20 සමරුව හා 1991 දී කොළඹ ක්‍රම 40 වන සමරුව වෙනුවෙන් ද මෙරටින් මුද්දර දෙකක් නිකුත් කරනු ලැබිණි. මෙවර එහි 50 වන සමරුව වෙනුවෙන් රු.10/- ක වටිනාකමින් යුත් මුද්දරයක් නිකුත් කෙරේ.

කොළඹ ක්‍රමය වෙනුවෙන් නිකුත් වී ඇත්තේ සීමිත මුද්දර ප්‍රමාණයකි. කොළඹ ක්‍රමයේ අපේක්ෂා හා ජයග්‍රහණ ඒවා මගින් සංකේතවත් වී තිබේ. ❑